එකදු කර පටියක් හෝ වලල්ලක් හෝ ඔටුවාගේ බෙල්ලේ ඉතිරි වන්නට ඉඩ නොහරින මෙන් පවසා දූතයකු එවා සිටියහ." යැයි දන්වා සිටියහ

අබූ බෂීර් අල් අන්සාරි (රළියල්ලාහු අන්හු) තුමා විසින් දන්වන ලදී: හෙතෙම සැබැවින්ම තමන් අල්ලාහ්ගේ දූතයාණන් සමග ඇතැම් ගමන් බිමන් හි නිරත වී ඇති බව පවසා, "ජනයා
ඔවුන්ගේ නවාතැන්හි සිටිය දී- එතුමා ‘එකදු කර පටියක් හෝ වලල්ලක් හෝ ඔටුවාගේ බෙල්ලේ ඉතිරි වන්නට ඉඩ නොහරින මෙන් පවසා දූතයකු එවා සිටියහ." යැයි දන්වා සිටියහ.
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ එතුමාණන්ගේ සමහර චාරිකාවල යෙදී සිටියහ. රාත්රියේ මිනිසුන් තම නවාතැන් සහ කූඩාරම්වල නැවතී නිදා සිටින ස්ථාන වලට පුද්ගලයෙකු යවා කොටලුවන්ගේ කරට දමා ඇති මාල, එය -දුන්නට සවි කර ඇති නූලක් මෙන්- නූලකින් හෝ වේවා හෝ සීනුව හෝ සපත්තු වැනි දැයින් වූ වෙනත් පටියකින් හෝ වේවා එය කපා දැමීමට ඔවුනට නියෝග කළහ. ඔවුන් එසේ කර වටා මාල දමා තිබුනේ නපුරු ඇසෙන් (ඇස්වහින්) වැළකී සිටීම සඳහා ය. එය ඔවුන්ගෙන් කිසිවක් පලවා නොහරින බැවින් හා සෙත හා හානිය, කිසිදු හවුල් කරුවකු නොමැති අල්ලාහ්ගේ දෑතෙහි පමණක් වන බැවින්, එය කපා හරින ලෙස ඔවුනට නියෝග කරනු ලැබීය.

http://sunnah.global/hadeeth/si/show/6761